සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25A | S | I

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................     ඉන්දියා ඉතිහාසය I     කාලය පැය එකයි

- **මෙම කොටසේ ප්‍රශ්න 40කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් එක් ප්‍රශ්නයට ප්‍රතිවාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ ඉන් එකක් පමණි. එම නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- **පසු I කොටස, II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.**

## I කොටස

- **අංක 01 - 10 තෙක් ඇති ප්‍රශ්න නාම 05 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නාම සමඟ නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉරමත ලියන්න.**

01. 1. ක්ෂත්‍රිය  2. බ්‍රාහ්මණ  3. චණ්ඩාල  4. වෛශ්‍ය  5. ශුද්‍ර  (.....)

02. 1. අංග  2. මගධ  3. කාසි  4. ලිච්ඡවි  5. කෝසල  (.....)

03. 1. ඍග්  2. යජුර්  3. පුරාණ  4. සාම  5. අතර්වන්  (.....)

04. 1. රාමායනය  2. මහා භාරතය  3. මහා වංශය  4. රාජතරංගණිය  5. දිව්‍යාවදානය  (.....)

05. 1. ඛයිබර්  2. බෝලාන්  3. මක්‍රාන්  4. හිමාලයා  5. බැරෝඩා  (.....)

06. 1. සත්ලෙජ්  2. බියස්  3. රාවි  4. ගංගා  5. ජේලම්  (.....)

07. 1. වින්ධ්‍යා  2. හින්දුකුෂ්  3. නිල්ගිරි  4. සත්පුර  5. මක්‍රාන්  (.....)

08. 1. සුප්පාරක  2. තාම්‍රලිප්ත  3. භාරුකච්ච  4. ලෝතාල්  5. කාවේරි  (.....)

09. 1. පල්ලව  2. ගුප්ත  3. අමරාවතී  4. ඇම්බැක්ක  5. පාණ්ඩ්‍ය  (.....)

10. 1. ශ්‍රාවස්ති  2. කුසිනාරා  3. සාංචි  4. සාරානාත්  5. තක්ෂිලා  (.....)

- අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන, ඊට අදාල අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. 1. ශ්‍රී ලංකා මූලාශ්‍රයකි - දීප වංශය
    2. රෝම මූලාශ්‍රයකි - නැචුරාලිස් හිස්ටෝරියා
    3. ග්‍රීක මූලාශ්‍රයකි - ඩිමුන්ඩෝ
    4. චීන මූලාශ්‍රයකි - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය
    5. ටිබෙට් මූලාශ්‍රයකි - තාරානාථයන්ගේ වාර්තා (.....)

12. 1. යමුනා - මථුරා
    2. ගංගා - තාම්‍රලිප්ත
    3. නර්මදා - භාරුකච්ඡ
    4. ක්‍රිෂ්ණා - උජ්ජෙයිනි
    5. කාවේරි - තංජෝර් (.....)

13. 1. පැරණි වරායකි - ලෝතාල්
    2. පැරණි කාර්මික නගරයකි - රබීගාර්
    3. චෛත්‍ය ගුහාවකි - කාරලේ
    4. අධ්‍යාපන මධ්‍යස්ථානයකි - තක්ෂිලා
    5. පැරණි ඓතිහාසික ස්ථානයකි - හතිගුම්පා (.....)

14. 1. වික්‍රමාංකදේව චරිතය - බිල්හාන
    2. රාම චරිතය - සන්ධ්‍යානන්දි
    3. කුමාර චරිතය - ජයසිංහ
    4. රාජතරංගණිය - භාණ භට්ට
    5. පංච තන්ත්‍රය - විෂ්ණු ශර්මන් (.....)

15. 1. බෞද්ධ ග්‍රන්ථයකි - මහා පරිනිබ්බාන සූත්‍රය
    2. ජෛන සාහිත්‍ය ග්‍රන්ථයකි - සාමාවතී සූත්‍රය
    3. ලෞකික මූලාශ්‍ර ග්‍රන්ථයකි - තර්ක ශාස්ත්‍රය
    4. ඓතිහාසික ග්‍රන්ථයකි - පංච තන්ත්‍රය
    5. ව්‍යාකරණ ග්‍රන්ථයකි - ශාකුන්තලය (.....)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් **X** හා **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලට නොවේ. **Y** තීරුව **X** තීරුව සමඟ ගැලපෙන අනුපිළිවෙලට සකස් කලවිට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුල ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | මහාභාරතය | A | උපදේශ කාව්‍යයකි |
| 2. | රාජතරංගණිය | B | නාට්‍යයකි |
| 3. | පංච තන්ත්‍රය | C | ඉතිහාස කෘතියකි |
| 4. | සාකුන්තලය | D | චරිතාපදානයකි |
| 5. | හර්ෂ චරිතය | E | වීර කාව්‍යයකි |

1. ABCDE  2. BECAD  3. CEABD  4. DBAEC  5. ECABD (.....)

17. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | සෝම | A | පරිපාලන ඒකකයකි |
| 2. | නිෂ්ක | B | ශුද්ධ වූ පානයකි |
| 3. | කුල | C | බලකොටු නගරය |
| 4. | පුර් | D | පවුල |
| 5. | රාෂ්ට්‍ර | E | පැරණි රන් කාසි වර්ගයකි |

1. ADCBE 2. BEDCA 3. CEBDA 4. DABEC 5. ECBAD (.....)

18. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | චතුර් වර්ණ | A | ඍග්, යජුර්, සාම, අතර්වන් |
| 2. | චතුර් වේද | B | බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි |
| 3. | චතුර් ආශ්‍රම | C | බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර |
| 4. | චතුර් සත්‍ය | D | සාම, දාන, භේද, දණ්ඩ |
| 5. | චතුර් උපායමාර්ග | E | දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග |

1. ABCDE 2. BACED 3. CABED 4. DABCE 5. EABCD (.....)

19. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | යම | A | පොළොවට අධිපති |
| 2. | පෘථිවි | B | මරණයට අධිපති |
| 3. | උෂා | C | ගින්නට අධිපති |
| 4. | සූර්‍ය | D | උදෑසනට අධිපති |
| 5. | අග්නි | E | දවසට අධිපති |

1. ABCDE 2. BADEC 3. CADEC 4. DEACB 5. EADBC (.....)

20. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | පුරෝහිත | A | සෙන්පති |
| 2. | සේනානි | B | රජුගේ උපදේශක |
| 3. | ග්‍රාමණී | C | සුදු පාලක |
| 4. | භාගදුග | D | ගම් ප්‍රධානී |
| 5. | අක්ෂාවාෂ | E | ආදායම් නිලධාරී |

1. ABCDE 2. BADCE 3. CADEB 4. DABCE 5. EABCD (.....)

- **අංක 21 - 25 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. කෞටිල්‍යාගේ අර්ථ ශාස්ත්‍රය දේශපාලන න්‍යාය ග්‍රන්ථයක් ලෙස පරිශීලනය කළ ශ්‍රී ලංකා රජු වන්නේ,
1. I පරාක්‍රමබාහු රජුය. 2. II පරාක්‍රමබාහු රජුය. 3. IV පරාක්‍රමබාහු රජුය.
4. V පරාක්‍රමබාහු රජුය. 5. VI පරාක්‍රමබාහු රජුය. (.....)

22. භ්‍රමණ වෘත්තාන්තයේ රචකයා කවුරුන්ද ?
1. මෙගස්තිනිස් 2. ප්ලිනි 3. හියුංසාං 4. වාල්මිකි 5. ටොලමි (.....)

23. ඉන්දියාව දෙකට බෙදන කඳුවැටිය කුමක් ද ?
1. හිමාලයා 2. වින්ධ්‍යා 3. නිල්ගිරි 4. සත්පුර 5. හින්දුකුෂ් (.....)

24. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් සොයා ගන්නා ලද දියුණුම කාර්මික නගරය කුමක් ද ?
1. හරප්පා 2. මොහෙන්ජොදාරෝ 3. රබීගාර්හි
4. කලිබන්සත් 5. කොත්ඩිජි (.....)

25. ඉන්දියාවේ දොරටුව ලෙස සැලකෙන දුර්ග මාර්ගය කුමක් ද ?
1. මක්‍රාන් 2. ඛයිබර් 3. බෝලාන් 4. බැරෝඩා 5. හේරත් (.....)

- **අංක 26 - 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාල මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

26. ඉන්දියාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර
1. පුරාණ ග්‍රන්ථ 18ක් පිළිබඳව සඳහන් වේ.
2. සංගම් සාහිත්‍යයෙන් ඓතිහාසික තොරතුරු රැසක් හෙළිවේ.
3. බෞද්ධ ග්‍රන්ථ රාශියක් මෙකල රචනා වී ඇත.
4. මහා වංශය ඉන්දියාවේ පැරණි ඓතිහාසික ග්‍රන්ථයකි.
5. විදේශීය සාහිත්‍ය මූලාශ්‍රවලින්ද ඉන්දීය ඉතිහාසය විස්තර කරයි. (.....)

27. පුරා විද්‍යාත්මක මූලාශ්‍ර
1. අශෝක සෙල්ලිපි මෞර්ය යුගය පිළිබඳ තොරතුරු හෙළි කරයි.
2. ප්‍රාකෘත, මාගධි, ග්‍රීක, ඇරමයික් ආදී භාෂාවන්ගෙන් සෙල්ලිපි රචනා වී ඇත.
3. අශෝක රජුගේ අලහබාද් ප්‍රශස්තිය දේශපාලන තොරතුරු හෙලි කරයි.
4. නාණක මූලාශ්‍ර ඉන්දීය ඉතිහාසයේ වැදගත් සාක්ෂි පෙන්වයි.
5. සමුද්‍රගුප්ත රජුට අයත් රන් කාසි හමු වී ඇත. (.....)

28. ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ
1. ඉන්දියාවේ ආරක්ෂකයා වූ හිමාලයා කඳු වැටිය ඉන්දියාවේ ඉතිහාසය ගොඩනගයි.
2. හිමාලයා කඳුවැටියේ උසම ස්ථානය එවරස්ට් හෙවත් ගෞරි ශංකර් වේ.
3. ඉන්දියාවේ වයඹ දිග ආරක්ෂකයා සුලෙයිමාන් කඳුවැටියයි.
4. උතුරු ඉන්දියාව, දකුණු ඉන්දියාවන් වෙන් කරන ප්‍රධාන භූගෝලීය පිහිටීම වින්ධ්‍යා කඳුවැටියයි.
5. තාර් කාන්තාරය ආක්‍රමණයින්ට උතුරු ඉන්දියාවට පිවිසීමේදී විශාල බාධකයක් විය. (.....)

29. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නගරය සැලසුම් හා නාගරික ලක්ෂණ,
1. රබීගාර්හි ප්‍රධාන වාණිජ නගරය මෙන්ම පරිපාලන නගරය වීම.
2. මොහෙන්ජොදාරෝ සහ හරප්පා යන නගර ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර 2 වීම.
3. පළල අඩි 10 - 30 අතර වූ සැතපුම් 2ක් පමණ විහිදුණු සෘජු මාර්ග පැවතීම.
4. මාර්ග ඉදිකිරීම සඳහා අමු ගඩොල් යොදා ගෙන තිබීම.
5. ප්‍රධාන නගර ආශ්‍රිතව මහල් නිවාස ඉදිකර ඇති බව. (.....)

30. ඉන්දියාවේ දුර්ග මාර්ග
1. හින්දුකුෂ් හා කොහිබබා කඳුවැටි අතර ඛයිබර් දුර්ගය පිහිටා තිබීම.
2. ඛයිබර් දුර්ගයට කි.මී. 800ක් දුරින් බෝලාන් දුර්ගය පිහිටා තිබීම.
3. ශකවරුන් ඉන්දියාවට පැමිණියේ ඛයිබර් දුර්ග මාර්ගයෙනි.
4. ඉන්දියාව ආක්‍රමණය කළ ඇලෙක්සැන්ඩර් අධිරාජයා ආපසු ගොස් ඇත්තේ මක්‍රාන් දුර්ගයෙනි.
5. ක්‍රි.ව. 8වන සියවසේ ඉන්දියාවට පැමිණි මොහොමඩ් බින් කාසිම් ඉන්දියාව ආක්‍රමණය කොට සාර්ථක ප්‍රතිඵල ලබාගත්තේ මක්‍රාන් දුර්ගය ඔස්සේ පැමිණීමෙනි. (.....)

- **ප්‍රශ්න අංක 31 - 35 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  **A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද**

  **B හා C පමණක් නිවැරදිනම් අංක 2 ද**

  **C හා D පමණක් නිවැරදිනම් අංක 3 ද**

  **A හා C පමණක් නිවැරදිනම් අංක 4 ද**

  **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් අංක 5 ද වරහන තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A හා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

31. ඉන්දියාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර,
    - A. ඉන්දියානුවන් ඉතිහාසය ලියා තැබීමට උනන්දුවක් දක්වා නැතිබව සුලෙයිමාන් ප්‍රකාශ කරයි.
    - B. පැරණිම කෘතිය ලෙස ඍග්වේදය ගීතිකා 1028 කින් ලියා ඇත.
    - C. භාරතීයයන් ඉතිහාසය ලිවීමට දැරූ උත්සාහයක් ලෙස පුරාණ ග්‍රන්ථ 18ක් ලියා ඇත.
    - D. මානව ශාස්ත්‍ර ධර්ම කෘති ඉතිහාසය හැදෑරීමට අදාල නොවේ. (.....)

32. කාසි,
    - A. ලෝහයෙන් තනා ඇති කාසිවල විවිධ සංකේත යොදා ඇත.
    - B. ගුප්තයන් විසින් උසස් තත්වයේ කාසි නිකුත් කර ඇත.
    - C. සාතවාහන පාලකයෝ කාසි නිකුත් නොකලහ.
    - D. කාසි මඟින් ඉන්දීය ඉතිහාසය අවබෝධ කරගත නොහැක. (.....)

33. හින්දුස්ථාන් තැනිතලාව
    - A. නැගෙනහිර සාට්ස්, බටහිර සාට්ස් නමින් කඳුවැටි පිහිටා ඇත.
    - B. උතුරේ හිමාලයා කඳුවැටියෙන් පටන් ගන්නා ප්‍රධාන ගංගා පහක් ඇත.
    - C. ගංගා යමුනා තැනිතලාව අධිරාජ්‍යවලට ජන්ම භූමිය විය.
    - D. ගංගා හා අතු ගංගාවලින් පෝෂණය වූ සශ්‍රීකත්වය ආර්ථිකය ශක්තිමත් කිරීමට හේතුවිය. (.....)

34. ඉන්දියානු ඉතිහාසය පිළිබඳ විදේශීය මූලාශ්‍ර,
    - A. චන්ද්‍රගුප්ත මෞර්ය රාජ සභාවට පැමිණි සෙලියුකස් නිකේටර්ගේ තානාපතිවරයා වූ මෙගස්තීනිස් ඉන්ඩිකා ග්‍රන්ථය රචනා කරන ලදී.
    - B. ව්‍යාස නම් පඬිවරයාගේ මහා භාරතය ඉන්දීය ඉතිහාසය හැදෑරීමේදී වැදගත් වේ.
    - C. ඉන්දීය ඉතිහාසය පිළිබඳ වැදගත්ම සටහන් ලියා ඇත්තේ හියුංසාං හිමියන් විසිනි.
    - D. රාම රාවණා කතා පුවතේ බොහෝ ඓතිහාසික තොරතුරු ඇතුළත් වේ. (.....)

35. ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණවලට අනුව,
    - A. ඛයිබර් දුර්ග මාර්ගය වැටී තිබුනේ කාබුල් නිම්නය ඔස්සේය.
    - B. බෝලාන් දුර්ගය ඔස්සේ ඉන්දියාව ආක්‍රමණය කළ එකම විදේශීය ජාතිය ශකයන් බව සලකයි.
    - C. මක්‍රාන් දුර්ගය පිහිටියේ බෝලාන් දුර්ගයට සැතපුම් 300ක් පමණ දකුණේය.
    - D. ඉන්දු නිම්නයේ සිට යමුනා නිම්නයට පිවිසෙන්නේ දිල්ලි කපොල්ල හරහාය. (.....)

- පහත දැක්වෙන අංක 36 - 40 තෙක් වූ ප්‍රශ්නවලට ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාල අංකය වරහන තුල ලියන්න.

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | වැරදිය |
| 2. නිවැරදිය | නිවැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 36. ඉන්දියාවේ ආරක්ෂකයා ලෙස හිමාලයා කඳුවැටිය ඉන්දියාවේ ඉතිහාසය ගොඩ නැගීමේදී වඩා වැදගත් වේ. | හිමාලයා කඳුවැටියේ අඩි 20, 000 ට වඩා වැඩි උස් වූ ශිඛර 150කින් පමණ සමන්විත වේ. (.....) |
| 37. ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතර අභිලේඛන ප්‍රධාන වේ. | අභිලේඛන යන්ත ගල්. මැටි, තඹ, රන්, ලෝකඩ, පිත්තල ආදී මාධ්‍යයකින් සැකසූ ලිපි වේ. (.....) |
| 38. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය දේශපාලන ග්‍රන්ථයක් ලෙස වැදගත් වේ. | චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ අමාත්‍ය කෞටිල්‍ය විසින් මෙය රචනා කරන ලද අතර සමකාලීන ග්‍රීක ඉතිහාසයේ තොරතුරු රැසක් මෙහි දැක්වේ. (.....) |
| 39. අලහබාද් ප්‍රශස්තිය අශෝක රජු විසින් කරවන ලදී. | මෙහි පළමු හා දෙවන කවි වලින් අශෝක රජුගේ සටන් පිළිබඳ සඳහන් වේ. (.....) |
| 40. මහා භාරතය කාලිදාස විසින් රචනා කරන ලදී. | රාමායනය වාල්මිකී නම් ඍෂිවරයෙකු විසින් සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලදී. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25A S II

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................. ඉන්දියා ඉතිහාසය II කාලය පැය දෙකයි

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න. (පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත)**

01. ඔබට සපයා ඇති සිතියමේ සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.
    (i) මක්‍රාන් දූර්ගය (ii) සුප්පාරක (iii) වින්ධ්‍ය කඳු (iv) කාවේරි පටුන
    (v) යමුනා (vi) තක්ෂිලා (vii) හරප්පා (viii) ජුනාගාද්
    (ix) ගෝව (x) පාඨලී පුත්‍ර (xi) තාම්‍රලිප්ති (xii) කාලිංගය
    (නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 01 බැගිනි) (ල. 12)

02. ඉන්දියානු ඉතිහාසය හැඩගැස්වීමෙහිලා වයඹ දිග කපොලු බලපෑ ආකාරය පරීක්ෂා කරන්න. (ල. 16)

03. දකුණු ඉන්දීය රාජ්‍ය පිළිබඳ අධ්‍යනයේදී සංගම් සාහිත්‍ය ලබාදෙන දායකත්වය පරීක්ෂා කරන්න. (ල. 16)

04. ''පැරණි ඉන්දීය ඉතිහාසය ගොඩනගා ගැනීමේදී ප්‍රමුඛත්වය ලැබෙනුයේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලටය.''
    (i) මෞර්‍ය යුගය පිළිබඳ තොරතුරු හෙළිවන ප්‍රධාන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය කුමක් ද ? (ල. 1)
    (ii) සමුද්‍රගුප්ත සමයට අයත් පුරා විද්‍යාත්මක සෙල්ලිපි 03ක් සඳහන් කරන්න. (ල. 3)
    (iii) නාණක මූලාශ්‍රවල ඓතිහාසික වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
    (iv) ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන ඓතිහාසික මූලාශ්‍රය ඇසුරෙන් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 8)

05. ඉන්දීය ඉතිහාසය ගොඩ නැඟීමේදී විදේශීය මූලාශ්‍රවලින් ලැබෙන් දායකත්වය ප්‍රමාණ කරන්න. (ල. 16)

06. පැරණි ඉන්දීය ඉතිහාසය හැඩගැසීම කෙරෙහි භූගෝලීය සාධකවල බලපෑම.
    (i) ඉන්දියාවේ කඳුවැටි
    (ii) ගංගා පද්ධතිය
    (iii) දූර්ග මාර්ග ඔස්සේ පැහැදිලි කරන්න. (ල. 16)

07. ''ඉන්දියානු ඉතිහාසය කෙරෙහි විශාල බලපෑමක් එල්ල කරන ලද්දේ දූර්ග මාර්ග ඔස්සේය.'' මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 16)

08. භූගෝලීය විවිධත්වය මඟින් ඉන්දියාව ඒකීය රටක් ලෙස ගොඩනැගුණ ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 16)

09. පහත දී ඇති කවර මාතෘකා 2ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    (i) වේද ග්‍රන්ථවල වැදගත්කම
    (ii) මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා
    (iii) සමුද්‍රගුප්ත අධිරාජ්‍යයාගේ අලහබාද් ප්‍රශස්තිය
    (iv) හිමාලය කඳුවැටිය (එක කොටසකට ලකුණු 8 බැගිනි) (ල. 16)

## පළමු වාර පරීක්ෂණය - ඉන්දියා ඉතිහාසය - පිළිතුරු


### 12 - ශ්‍රේණිය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **01. -** | 3 | **11. -** | 4 | **21. -** | 1 | **31. -** | 2 |
| **02. -** | 4 | **12. -** | 4 | **22. -** | 3 | **32. -** | 1 |
| **03. -** | 3 | **13. -** | 5 | **23. -** | 2 | **33. -** | 3 |
| **04. -** | 3 | **14. -** | 4 | **24. -** | 3 | **34. -** | 4 |
| **05. -** | 4 | **15. -** | 5 | **25. -** | 2 | **35. -** | 5 |
| **06. -** | 4 | **16. -** | 3 | **26. -** | 4 | **36. -** | 1 |
| **07. -** | 5 | **17. -** | 2 | **27. -** | 3 | **37. -** | 5 |
| **08. -** | 4 | **18. -** | 3 | **28. -** | 3 | **38. -** | 2 |
| **09. -** | 4 | **19. -** | 2 | **29. -** | 4 | **39. -** | 3 |
| **10 -** | 5 | **20. -** | 2 | **30. -** | 3 | **40. -** | 4 |

(ලකුණු 40)

### II කොටස




01. සිතියම ලකුණුකර ඇති නිවැරදි ආකාරයට අනුව ලකුණු ලබා දෙන්න.

02. ඉන්දියාවේ වයඹ දිග කපොලු පැරණි ඉන්දීය ඉතිහාසයේ කැපී පෙනෙන ලක්‍ෂණ පෙන්නුම් කරයි. ඒ අතරින් ප්‍රධාන කපොලු 4ක් හඳුනාගත හැකිය.
   1. ඛයිබර් දුර්ගය- කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවෝර් දක්වා වැටී ඇත.
   2. බෝලාන් දුර්ගය - ඛයිබර් දුර්ගයට දකුණින් සුලෙයිමාන් කඳුවලට බටහිර දිශාවෙන් පිහිටා ඇත.
   3. මක්‍රාන් දුර්ගය - කිර්තාර් කඳු හා අරාබි මුහුද අතර පිහිටා ඇත.
   4. හේරාත් දුර්ගය - ඇෆ්ගන් කඳු ආශ්‍රිතව ඉන්දු නිම්නය දක්වා වැටී ඇත.

* මෙම දුර්ග හරහා පැමිණි පිරිස් ඉන්දියාවේ පදිංචි වූ ආකාරය.
* විජාතික පිරිස් ඉන්දීය භූමිය තුළ දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනඟා ගැනීම.
* ඉන්දියාවේ සිට ඉන්දියාවෙන් ඔබ්බට ඉන්දීය බලය පැතිරවීම.
* ඉන්දියාවේ ආගමික හා සංස්කෘතික වෙනස්වීම් කෙරෙහිද මේ දුර්ගවලින් පැමිණි අය බලපෑම් එල්ල කිරීම.
* ආර්ය සංක්‍රමණ නිසා යාග හෝම ඇතිවීම.
* දේව වන්දනය, ගිනි, ජල, වෘක්ෂ වැනි ස්වාභාවික වස්තූන් වන්දනා කිරීම ආදී ආගමික ලක්ෂණ ඉන්දියාවේ ව්‍යාප්තවීම. ආදී ලෙස විස්තර කරන්න.

03. ඉන්දීය ඉතිහාසය පිළිබඳ හැදෑරීමේදී දේශීය සාහිත්‍ය මූලාශ්‍රයක්වන සංගම් සාහිත්‍ය වෙනත් සාහිත්‍ය ග්‍රන්ථ අතර වැදගත් මෙහෙයක් ඉටු කිරීම.
* සංගම් සාහිත්‍ය ක්‍රි.ව. 1 සියවසේ සිට 3වන සියවස තෙක් දකුණු ඉන්දීය පාණ්ඩ්‍ය රාජ්‍යයෙන්හිදී ඒකරාශී වූ සංගම් රචිත සාහිත්‍ය ග්‍රන්ථ සමූහයයි.
* මින් පළමුවැන්න තෙන්මදුරෙයිහිදීත්, දෙවැන්න කබාඩපුරම්හිදීත්, තුන්වැන්න මධුරෙයිහිදීත් පැවැත්වීම.
* මෙම සාහිත්‍ය ග්‍රන්ථ මගින් ඉන්දියාවේ තක්කාලීන ආර්ථික, දේශපාලන, සංස්කෘතික තොරතුරු අනාවරණය වීම.
* රාජ්‍ය අනුග්‍රහයය ලැබූ 500කට අධික කවීන් මෙකල සිටීම.
* මෙම කවීන් අතර කාන්තාවක්ද සිටීම.
* දෙමළ රාජධානිවල ඉතිහාසය හැදෑරීමේදී දැනට ශේෂව ඇති පැරණිම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ සංගම් සාහිත්‍යයි. මෙයින් මුල් කාලය පිළිබඳ තොරතුරු අනාවරණය වෙයි.
* මෙම සාහිත්‍ය පොත් 8 කින් යුක්තය. මේ සංග්‍රහ සියල්ල පේළි 4කින් 5කින් යුක්තවන අතර කාව්‍ය 2279 කින් යුක්ත වේ.
* මේවා රචනා කොට ඇත්තේ කවීන් 473 දෙනෙකු විසිනි. ඒ අතර නිර්නාමික රචනාද ඇත. මේ සෑම කාව්‍යක් අවසානයෙහි කර්තෘගේ නමත් රචනා කිරීමට හේතු වූ කරුණුත් සඳහන් කොට ඇත.
* සංගම් සාහිත්‍යයේ පළමු සංගමය කවීන් 4449 එක්ව මධුරාවේ දකුණේ ද, දෙවැන්න කවීන් 3700 ක් එක් කබාඩ්පුරම්හිදී ද, තුන්වැන්න කවීන් 444 ගේ සහභාගිත්වයෙන් මධුරෙයිහිදීහි පැවැත්විය. ආදී ලෙස විස්තර කරන්න. (ල. 16)

04. i. අශෝක සෙල්ලිපි

ii. ඊරාන් සෙල්ලිපිය, ගයා ලිපිය, නාලන්දා ලිපිය.

iii. * නාණක මූලාශ්‍රවලින් වෙළඳාම, ආර්ථික තත්ත්වය, ජන ජීවිතය, ආක්‍රමණ, රාජධානී බිඳවැටීම ආදී තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකිවීම.
* කාසිවල සඳහන් රූප සටහන්, සංස්කෘත සහ පාඨ ආදිය මඟින් ඒවා නිකුත් කළ රජුන්, ප්‍රධානීන්, වෙළඳ ශ්‍රේණි, නාගරිකයන් ගැන තොරතුරු ලැබීම.
* රන්, රිදී, තඹ සහ ලෝකඩ ආදී යොදාගත් මාධ්‍ය අනුව තත්කාලීන ආර්ථික තත්වයේ ස්වරූපය අනාවරණය වීම.
* බැක්ට්‍රියානු කාසි, ග්‍රීක කාසි, කුෂාණ කාසි, ගුප්ත කාසි, සමුද්‍රගුප්ත රජුට අයත් කාසි, ගණ රාජ්‍යයන්ට අයත් කාසි, ඉන්දීය ඉතිහාසය පිළිබඳ තොරතුරු හෙළි කරයි.

iv ඉන්දීය ඉතිහාසය හැදෑරීමේදී ඓතිහාසික මූලාශ්‍ර මෙන්ම පුරවිද්‍යාත්මක මූලාශ්‍රද වැදගත් වීම.
* සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් තහවුරු කරගත හැකිවීම.
* විවිධ කාල වකවානුවල කොටවා ඇති සෙල්ලිපි මඟින් ඒ ඒ යුගවල හෝ පසුකාලීනව රචනා කරන ලද සාහිත්‍ය මූලාශ්‍ර මඟින් තහවුරු කරගත හැකිවීම.
* මෞර්‍ය යුගය, කුෂණ යුගය, ගුප්ත යුගය ආදී රාජ්‍ය පාලන කටයුතු පිළිබඳ දේශීය සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් තොරතුරු එකල නිකුත් කරන ලද කාසිවලින් සහ කොටවන ලද සෙල්ලිපිවලින් තහවුරු කරගත හැකිවීම. ආදී ලෙස විස්තර කරන්න. (ල. 8)

05. * ඉන්දීය ඉතිහාසය ගොඩනැගීමේදී විදේශීය සාහිත්‍ය මූලාශ්‍රවලින් ලැබෙන පිටුවහල සුළු පටු නොවේ.
* විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර ශ්‍රී ලංකාවේ මූලාශ්‍ර, ග්‍රීක මූලාශ්‍ර, රෝම මූලාශ්‍ර, චීන මූලාශ්‍ර, අරාබි මූලාශ්‍ර, ටිබෙට් මූලාශ්‍ර, වැදගත්වීම.
* කැපී පෙනෙන විදේශීය මූලාශ්‍ර ලෙස මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා, කෞටිල්‍යාගේ අර්ථ ශාස්ත්‍රය, හියුංසාං හිමියන්ගේ වාර්තා වැදගත්වීම.
* මෙම විදේශීය මූලාශ්‍රවල සමකාලීන ඉන්දියාව පිළිබඳ වැදගත් තොරතුරු රැසක් අන්තර්ගත වීම.
* ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ, සමාජය, පාලන ක්‍රම, මෞර්‍ය රජ මාලිගය, පාඨලී පුත්‍ර නගරය හා එහි පාලනය ආදී වැදගත් තොරතුරු රැසක් අන්තර්ගතවීම.
* ඉන්දීය ඉතිහාසය පිළිබඳ වැදගත්ම සටහන් ලියා ඇත්තේ හියුංසාං හිමියන් වීම.
* නාලන්දා විශ්ව විද්‍යාලය පිළිබඳ තොරතුරු ලැබෙන එකම ග්‍රන්ථය හියුංසාං හිමියන් විසින් රචිත භ්‍රමණ වෘත්තාන්තය වීම.
* ඉන්දියාවේ අඛණ්ඩව පවත්වාගෙන ආ මූලාශ්‍ර සම්ප්‍රදායයක් නොවූ බැවින් විදේශීය සාහිත්‍ය මූලාශ්‍රවලින්ද විශාල පිටුවහලක් ලැබුණු බව. ආදී වශයෙන් විස්තර කරන්න.

06. (i) ඉන්දියාවේ කඳුවැටි
* ඉන්දියාවේ පිහිටා ඇති හිමාලයා කඳුවැටිය, හින්දුකුෂ්, වින්ධ්‍යා හා සත්පුර කඳු, ආරවල්ලි කඳුවැටිය, නැගෙනහිර සාට්ස් හා බටහිර සාට්ස් කඳුවැටි භූගෝලීය ලක්ෂණ කෙරෙහි බලපෑම.
* ඉන්දියාවේ ආරක්ෂකයා වූ හිමාලයා කඳුවැටිය ඉන්දියාවේ ඉතිහාසය ගොඩනැගීමේදී අතිශය වැදගත්වීම. අඩි 20000කට වඩා උස් වූ ශිඛර 114කින් පමණ සමන්විතවීම. උසම ශිඛරය අඩි 29140 ක් උස වූ එවරස්ට් හෙවත් ගෞරි ශංකර්ය.

* ඉන්දියාව ආසියා මහද්වීපයේ සෙසු රටවලින් වෙන් කරන්නේ හිමාලයා කඳුවැටියයි.
* ආසියානු මහද්වීපයේ සිට ගොඩබිම් මාර්ගයකින් ඉන්දියාවට සංක්‍රමණයවීමේදී හෝ ආක්‍රමණයක් මෙහෙයවීමේදී ප්‍රධානතම බාධාව වූයේ හිමාලයා කඳුවැටියයි.
* උතුරු දෙසින් ඉන්දියාවට මහා ආරක්ෂාවක් සපයමින් ආසියාවෙන් වෙන් කිරීමට සමත් වූ හිමාලය පර්වතය නිසාම පැරණි ඉන්දියානුවන් තමාට ආවේණික සංස්කෘතියක් ගොඩනැගීමට හැකිවීම.
* හින්දුකුෂ් කඳුපෙළ නිසා පැරණි ඉන්දියාව පර්සියාව හෙවත් ඉරානයෙන් වෙන්වීම. මෙම කඳුපෙළ ඉන්දියාවට ආරක්ෂාව සැපයූ මහා ආරක්ෂකයෙකු වුවත් මෙම කඳු පෙළේ තැන තැන පහත් දුර්ග පිහිටා තිබීම. ඛයිබර් හා බෝලාන් දුර්ග ඒ අතරින් වඩාත් වැදගත් වීම.
* හින්දුකුෂ් කඳු පෙළේ උතුරෙන් පටන්ගෙන ඇද හැලෙන ස්වාත්, චිත්‍රාල්, ගුමාල්, කාබුල්, තෝචි, කුරාම් ආදී නදී නිම්නද ඉන්දියාවට පිවිසීමේ මාර්ග ලෙස ප්‍රයෝජනයට ගැනීම.
* උතුරු ඉන්දියාවෙන් දකුණු ඉන්දියාවන් වෙන්කරන ප්‍රධාන භූගෝලීය පිහිටීම වින්ධ්‍යා කඳුවැටිය වීම. ආදී ලෙස විස්තර කරන්න.

(ii) ගංගා පද්ධතිය

* ඉන්දියාවේ පිහිටි ගංගා පද්ධතිය ඉන්දීය ඉතිහාසය ගොඩනැගීමේදී අතිශය වැදගත් සාධකයක් වීම.
* වයඹ දිග ඉන්දියාවේ පිහිටි ප්‍රධානතම ගංගාව සින්දු ගංගාවයි. සින්දු නදිය කේන්ද්‍ර කොටගෙන පිහිටි පංජාබ් තැනිතලාව වයඹ දිග ඉන්දියාවේ පිහිටි සුවිශේෂීම කලාපයයි. ලොව බිහිවූ දියුණුතම ශිෂ්ඨාචාරයක් වන හරප්පා ශිෂ්ඨාචාරය සින්දු නදිය කේන්ද්‍ර කොට ගෙන බිහිවීම.
* උතුරු ඉන්දියාවේ පිහිටි ගංගා සහ යමුනා නදීන් ඉන්දීය ඉතිහාසය වෙනස් කිරීමට බලපෑ ප්‍රධාන ගංගා දෙක වීම.
* මෙම ගංගා දෙක සහ ඒවායේ ශාඛාවන්ගෙන් පෝෂණය වන තැනිතලාව, ගංගා යමුනා තැනිතලාවයි. (හින්දුස්ථාන තැනිතලාව) මෙම තැනිතලාව නැගෙනහිර සිට බටහිරට කි.මී. 3200 ක් දුරට විහිදීම.
* ක්‍රිෂ්ණ - තුංගභද්‍ර ගඟ බඩ පිහිටි රායිමුර් දෙගම්මැදිය ඉන්දීය ඉතිහාසයේ තීරණාත්මක සටන් ඇති වූ ස්ථානයක් වීම.
* නර්මදා, තප්ති, මහානදී, කාවේරි ආදී ගංගා රාශියකින් ඉන්දියාව පෝෂණය වීම. මෙම නදීන ශාඛා ප්‍රශාඛා වශයෙන් ඉන්දියාව පුරා ව්‍යාප්තවීම නිසා සරුසාර ප්‍රදේශ රාශියක් ඉන්දියාවේ නිර්මාණයවී තිබීම.

(iii)දුර්ග මාර්ග

* හින්දුකුෂ්, සුලෙයිමාන්, නිර්තාර් කඳු වැටිවලින් වයඹ දිග ඉන්දියාව ආරක්ෂා වුවද, එම කඳුවැටි අතර පිහිටි ස්වභාවික කපොලු නිසා ආක්‍රමණකි හා සංක්‍රමණික පිරිස්වලට ඉන්දියාවට පිවිසීමේම අවස්ථාව හිමිවීම.

වයඹ දිග දුර්ග මාර්ග

* ඛයිබර් දුර්ගය- කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවෝර් දක්වා.
* බෝලාන් දුර්ගය -සුලෙයිමාන් කඳුවලින් බටහිරින් පිහිටා ඇත.
* මක්‍රාන් දුර්ගය - නිර්තාර් කඳු හා අරාබි මුහුද අතර පිහිටා ඇත.
* හේරාන් දුර්ග මාර්ගය - ඇෆ්ගන් කඳු හා අරාබි මුහුද අතර පිහිටා ඇත.
* ඉහත දුර්ග මාර්ග අතරින් හින්දුකුෂ් හා කොහි බබා කඳුවැටි අතර පිහිටි ඛයිබර් දුර්ගය ඉන්දියාවේ දොරටුව ලෙස හඳුන්වන අතර අතීතයේ සිටම බොහෝ ආක්‍රමණික හා සංක්‍රමණික පිරිස් මෙම දුර්ගය ප්‍රයෝජනයට ගැනීම.
* ඛයිබර් දුර්ගයට කි.මී. 800ක් ඈතින් පිහිටි බෝලාන් දුර්ගය වයඹ දිග ඉන්දියාවේ තවත් දුර්ග මාර්ගයකි.
* ඉහත දුර්ග මාර්ග අතරින් හින්දුකුෂ් හා කොහි බබා කඳුවැටි අතර පිහිටි ඛයිබර් දුර්ගය ඉන්දියාවේ දොරටුව ලෙස හඳුන්වන අතර අතීතයේ සිටම බොහෝ ආක්‍රමණික හා සංක්‍රමණික පිරිස් මෙම දුර්ගය ප්‍රයෝජනයට ගැනීම.
* ඛයිබර් දුර්ගයට කි.මී. 800 ක් ඈතින් පිහිටි බෝලාන් දුර්ගය වයඹ දිග ඉන්දියාවේ තවත් දුර්ග මාර්ගයකි.
* බෝලාන් දුර්ගයට කි.මී. 480ක් පමණ දුරින් මක්‍රාන් දුර්ගය පිහිටා තිබීම.
* මෙම දුර්ග මාර්ග ඔස්සේ පැමිණි විවිධ විජාතික පිරිස් නිසා ඉන්දියාව තුළ දේශපාලන ස්ථාවරවත්යක් ගොඩනගා ගැනීමත් සමඟ ඉන්දීය රාජවංශවල බලය දුර්වල කිරීමට සමත් වීම.
* ග්‍රීක, චීන, උර්දු, පර්සියන් හා රෝම වැනි භාෂා ඉන්දියාව තුළ ව්‍යවහාරයට පත්වීම. ගෘහ නිර්මාණ, මූර්ති ශිල්පය, චිත්‍ර කලාව, වෛද්‍ය හා ජ්‍යෝතිෂය වැනි සංස්කෘතිකාංග ඉන්දියානු ජන සමාජයට එකතු වීම. ආදී ලෙස විස්තර කරන්න.

07. * ඛයිබර් දුර්ගය ඉන්දියාවේ දොරටුව ලෙස සැලකීම.
* අතීතයේ සිටම බොහෝ ආක්‍රමණික හා සංක්‍රමණික පිරිස් මෙම දුර්ග ප්‍රයෝජනයට ගැනීම.
* ඛයිබර් දුර්ගය තරණය කර ඉන්දියාවට පැමිණෙන්නන් සරුසාර පංජාබ් ප්‍රදේශයට එකවර පැමිණිය හැකි වීම.
* ඛයිබර් දුර්ගයට කි.මී. 800 ක් ඈතින් පිහිටි බෝලාන් දුර්ගය වයඹ දිග ඉන්දියාවේ තමන් දුර්ග මාර්ගයක් වන අතර පර්සියාවේ හෙල්මැන්ඩ් ගංගාධාරය වෙත පැමිණි ආක්‍රමණික හා සංක්‍රමණික කණ්ඩායම්වලට ඉන්දියාවට ඇතුළුවීමට තිබූ ළඟම දුර්ග මාර්ගය වීම.
* ශකවරුන් ඉන්දියාවට පැමිණියේද මෙම බෝලාන් දුර්ග මාර්ගයෙන් වීම.
* බෝලාන් දුර්ගයට කි.මී. 480ක් දුරින් මක්‍රාන් දුර්ගය පිහිටා ඇති අතර අතිශය දුෂ්කර මාර්ගයක් වූ මෙය මක්‍රාන් වෙරළ ඔස්සේ විහිදී යයි. මෙම දුර්ගය ඔස්සේ පැමිණි පිරිස්වලින් විශාල සංඛ්‍යාවක් මියගොස් ඇත.
* ඉන්දියාව ආක්‍රමණය කළ මහා ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයා ආපසු ගොස් ඇත්තේද මෙම දුර්ග මාර්ගයෙන් බවත් එහිදී ඔහුගේ චේතනාවෙන් විශාල පිරිසක් මියගිය බව සඳහන් වේ.
* මෙම දුර්ගය ඔස්සේ ඉන්දියාව ආක්‍රමණය කොට සාර්ථක ප්‍රතිඵල ලබාගන්නා ලද්දේ ක්‍රි.ව. 8වන සියවසේ ඉන්දියාවට පැමිණි මොහොමඩ් බින් කාසිම් පමණි. (ආදී ලෙස විස්තර කරන්න)

08. i. ඉන්දියාවේ විශාලත්වය හා විවිධත්වය තුලින් ඉන්දියාව තුල දේශපාලන, ආර්ථික සමාජ හා සංස්කෘතික වශයෙන් විවිධත්වයක් දැකිය හැකිවීම.

* විවිධ භූගෝලීය ලක්ෂණ - කඳුවැටි, ගංගා, වරායන්, කපොලු, දූර්ග, පිහිටීම තුලින් ඒකීයත්වය.
* විවිධ ආගමික දර්ශන පැවතීම - බහුදේව වාදය, ඒකදේව වාදය දක්වා ව්‍යාප්ත වීම.
* විවිධ සංස්කෘති පැවතීම - ගන්ධාර, මථුරා, අමරාවතී යන ............ සම්ප්‍රදාය.
* විවිධ භාෂා පැවතීම - ග්‍රීක, චීන, උර්දු, පර්සියන්, රෝම වැනි භාෂා ඉන්දියාව තුළ ව්‍යාප්ත වීම.
* විවිධ ජන වර්ග වාසය කිරීම - විදේශීය ජන කණ්ඩායමක් වූ කුෂාණ, දිල්ලි සුල්තාන් රාජ්‍ය, ඩෙකෑනයේ මුස්ලිම් රාජ්‍ය, දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය, විජය නගර් වැනි රාජ්‍ය බිහිවීම.
* ජාත්‍යන්තර සබඳතා පැවැත්වීම - චීනය, මධ්‍ය ආසියාව, අරාබිය, පර්සියාව, ග්‍රීසිය ආදී විවිධත්වය තුලින් ඉන්දියාවේ ඒකීය භාවය ගොඩනගා ගැනීම. ඒ අනුව ඉන්දියාවට ආවේණික වූ ඉන්දියානුකරණය තුලින් ඒකීය රටක් ලෙස ගොඩ නැගුණු ආකාරය විස්තර කරන්න. (ල. 16)

09. i. **වේද ග්‍රන්ථවල වැදගත්කම**

* වෛදික සාහිත්‍ය තුල වේද ග්‍රන්ථ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර තුළ වැදගත් තැනක් හිමිවීම.
* වේද ග්‍රන්ථ ක්‍රි.පූ. 5වන සියවස තෙක් කාලය තුල රචනා වූ පොත්පත්ය.
* වේද ග්‍රන්ථ 4ක් ප්‍රධාන වශයෙන් වැදගත් වීම. ඍග්, යජුර්, සාම අථර්වන් ලෙස.
* ඍග් වෛදික යුගයේදී රචනා වූ ඍග් වේදය හා පශ්චාත් වෛදිකක යුගයේ ලියැවී ඇති වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද්, පුරාණ, උපවේද සහ සූත්‍ර.
* ආර්‍යන්ගේ දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජීය තොරතුරු රැසක් හෙලිවීම.
* බ්‍රාහ්මණ ග්‍රන්ථ - වෛදික මන්ත්‍රයන්ට අර්ථ විවරණ සපයමින් ගද්‍යයෙන් ලියැවී තිබීම.
* ආරණ්‍යක ග්‍රන්ථ - දෙවියන්, ආත්මය, ලෝකය හා මිනිසා පිළිබඳ දැනීම ආදී විවරණය කිරීම.
* උපනිෂද් ග්‍රන්ථ - කර්ම හා ඥාන යන අංශ 2ක් පිළිබඳ අවධානය යොමු කර තිබීම.
* පුරාණ ග්‍රන්ථ - පරම්පරා කතා යන්න මෙහි අර්ථයයි. පූර්ණ ග්‍රන්ථ 18ක් පිළිබඳ සඳහන් වේ. .... ආදී ලෙස විස්තර කරන්න.

ii. **මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා**

* මෞර්‍ය චන්ද්‍රගුප්ත රාජ සභාවට පැමිණි සෙලියුකස් නිකේටර්ගේ තානාපතිවරයා වූ මෙගස්තිනිස් විසින් මෙය රචනා කරන ලදී.
* ඔහු ලියූ ඉන්ඩිකා ග්‍රන්ථයේ මුල් පිටපත ලැබී නොමැත.
* විවිධ පුද්ගලයන්ගෙන් අසා දැනගත් තොරතුරු ද තිබෙන නිසා ඇතැම් තොරතුරු විශ්වාසනීය නොවේ. (කුල ක්‍රමය, වහල් ක්‍රමය)
* සමකාලීන ඉන්දියාව පිළිබඳව වැදගත් තොරතුරු රැසක් අන්තර්ගත වේ.
* ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ, සමාජය, පාලනය, මෞර්‍ය රජ මාලිගය, පාඨලී පුත්‍ර නගරය හා එහි පාලනය ආදී වැදගත් තොරතුරු රැසක් අන්තර්ගත වීම.
* පසුකාලීන ග්‍රීක, රෝම ලේඛනයන් එම මුල් කෘතියෙන් උපුටා ගෙන සටහන් කල දේ ඉතිරි වී තිබේ.
ආදී ලෙස විස්තර කරන්න.

iii. **අලහබාද් ප්‍රශස්තිය**

* මෙය ප්‍රයාග නම් ස්ථානයේ පිහිටුවා ඇත.
* සමුද්‍රගුප්ත රජුගේ දේශපාලන කාර්‍ය සංසිද්ධිය අධ්‍යයනය කිරීමේදී වැදගත් වේ.
* අශෝක රජුගේ අලහබාද් ටැම් ලිපියේ ප්‍රතිමුඛයේ කොටවා ඇත.
* සමුද්‍රගුප්තයන්ගේ සටන් ව්‍යාපාරය අවසානයේ ඔහු ''සටන් සියයක වීරයා'' ලෙස මෙහි හඳුන්වයි.
* ගද්‍ය හා පද්‍ය දෙයාකාරයකට රචිත මෙහි ඇතැම් කොටස් විනාශ වී තිබේ.
* මෙහි ප්‍රශස්ති කවි අටෙන් පහත තොරතුරු හෙළිවේ.
  - පළමු හා දෙවන කවිවලින් I වන චන්ද්‍රගුප්තගේ සටන්ද.
  - තෙවන කවියෙන් සමුද්‍රගුප්තයන්ගේ ප්‍රඥාවන්ත බවද.
  - සිව්වන කවියෙන් පියා විසින් ඔහු රාජ්‍යත්වයට නම් කිරීම.
  - පස්වන, හයවන කවිවලින් රාජ්‍යත්වය තහවුරු කර ගැනීමට ගෙනගිය සටහන් ව්‍යාපාරත්.
  - හත්වන හා අටවන කවිවලින් ඔහුගේ යුධ ප්‍රධානයන්හි අවස්ථා 4ක් පිළිබඳවද දක්වයි. ඒවානම් .... ආදී ලෙස විස්තර කරන්න.

iv. **හිමාලයා කඳුවැටිය**

* හිමාලයා කඳුවැටිය ඉන්දියාව හුදෙකලා බවට පත් කිරීමට සමත්වී යැයි අදහසක් පැවතීම.
* ඉන්දියාව ආරක්ෂා කිරීමේ මහා පවුර හෙවත් ඉන්දියාව ආසියාවෙන් වෙන්කරන මහා බාධකය හිමාලය කඳුවැටිය සමත්වීම.
* ඉන්දියාවේ ආරක්ෂකයා වූ හිමාලයා කඳුවැටිය ඉන්දියාවේ ඉතිහාසය ගොඩ නැඟීමේදී අතිශය වැදගත් වීම. අඩි 20000 කට වඩා උස් වූ ශිඛර 114 කින්ද උසම ශිඛරය අඩි 29140 ක් උස් වූ එවරස්ට් හෙවත් ගෞරි ශංඛර්ය.
* ඉන්දියාව ආසියා මහද්වීපයේ සෙසු රටවලින් වෙන් කරන්නේ හිමාලයා කඳුවැටියයි. ආසියානු මහද්වීපයේ සිට ගොඩබිම් මාර්ගයකින් ඉන්දියාවට සංක්‍රමණයවීමේ හෝ ආක්‍රමණයක් මෙහෙයවීමේදී ප්‍රධානතම බාධකය වූයේ හිමාලයා කඳුවැටියයි.
* ඉන්දු ගංගා තැනිතලාවන්හි පසෙහි සරුසාරත්වය රැකෙන ඒවා මුළු ඉන්දියාවේම සශ්‍රික ප්‍රදේශ බවට පත් කිරීමටද එමගින් සැලසුණු සේවය අති විශාලය. ආදී ලෙස විස්තර කරන්න.